සැ. යු. - 2009.01.23 දින පළ වූ අංක 1,586 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,587 - 2009 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2009.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 136 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 137 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 138 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 පෙබරවාරි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ජනවාරි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන"**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පූගොඩ

### අධිකරණ වෙත ඉදිරිපත් කරන භාණ්ඩ වලින් හිමිකම් නොපාන ලද හා රාජ සන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පූගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ වූ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2009.02.14 වැනි දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන යම් අයෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර තම හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසියට සූදානම් කර ඇති භාණ්ඩ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණ සතුව පවතී.

05. වෙන්දේසියෙන් ලබා ගන්නා ලද භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, ගෙවීම් සියල්ලම මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ලබා ගැනීමට අදහස් කරන සෑම අයෙකුම තමාගේ ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණිය යුතුය.

ඩබ්ලිව්. පී. එස්. නිශ්ශංක,
දිසා විනිසුරු,
පූගොඩ.

2009 ජනවාරි මස 08 වැනි දින,
පූගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|---|
| 01. | 81966 | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | ii. | ගෑස් ලිප් | 01යි |
| 02 | 86861 | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| 03 | 5191 | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| 04 | 80415 | ii. | ගෑස් ලිප් | 01යි |
| 05 | 5540 | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | ii. | ගෑස් ලිප් | 01යි |
| | | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | ii. | ගෑස් ලිප් | 02යි |
| | | iii. | ගෑස් රෙගියුලේටර් | 01යි |
| 06 | අංක රහිත | | ගෑස් ලිප් | 03යි |
| 07 | 63028 | | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 08 | 56969 | | බාල්දි | 01යි |
| 09 | 56970 | | බාල්දි | 01යි |
| 10 | 57702 | | සවල් | 01යි |
| 11 | 57703 | | බාල්දි | 01යි |
| 12 | 57711 | | බාල්දි | 01යි |
| 13 | 57712 | | බාල්දි | 01යි |
| 14 | අංක රහිත | | බාල්දි | 02යි |
| 15 | 57706 | | බාල්දි | 01යි |
| 16 | 57707 | | බාල්දි | 01යි |
| 17 | 53273 | | බාල්දි | 01යි |
| 18 | 50626 | i. | උදළු | 01යි |
| | | ii. | බාල්දි | 01යි |
| 19 | 64878 | | බාල්දි | 05යි |
| 20 | 64876 | 1. | බාල්දි | 02යි |
| | | ii. | සවල් | 01යි |
| 21 | 65080 | | බාල්දි | 05යි |
| 22 | 65079 | 1 | බාල්දි | 09යි |
| | | ii. | සවල් | 01යි |
| 23 | 65582 | | බාල්දි | 01යි |
| 24 | 65583 | | බාල්දි | 01යි |
| 25 | 65625 | | බාල්දි | 01යි |
| 26 | 65626 | | බාල්දි | 02යි |
| 27 | 65627 | | බාල්දි | 04යි |
| 28 | 65739 | | බාල්දි | 01යි |
| 29 | 65740 | | බාල්දි | 01යි |
| 30. | 65917 | | බාල්දි | 02යි |
| 31. | 65942 | | බාල්දි | 01යි |
| 32. | 65946 | | බාල්දි | 01යි |
| 33. | 65988 | | බාල්දි | 02යි |
| 34. | 66236 | | බාල්දි | 01යි |
| 35. | 66279 | | බාල්දි | 02යි |
| 36. | 66280 | | බාල්දි | 02යි |
| 37. | 66281 | | බාල්දි | 02යි |
| 38. | 66282 | | බාල්දි | 02යි |
| 39. | 66287 | | බාල්දි | 01යි |
| 40. | 5766 | | ඇළුමිනියම් මුට්ටි | 01යි |
| 41. | 43810 | | රවුම් කියත්තල | 01යි |
| 42. | 95500 | | යකඩ කම්බිකූරු තොගයක් | |
| 43. | ඒ/910/66 | | අංක කේ 2616 දරන මෝටරය හා ඩීඑම්වී කොළපාට එන්ජින් එක සහිත මැණික් ගැරීමේ උපකරණ කට්ටලය | |
| 44. | ඒ/220/07 | | හොන්ඩා වර්ගයේ වතුර මෝටර් | 01යි |
| 45. | ඒ/560/07 | i. | පී 100 හොන්ඩා වර්ගයේ වතුර මෝටර් | 01යි |
| | | ii. | ටයිගර් ක්ලැසික් වර්ගයේ රතු පැහැති කම්ප්‍රේෂර් ටැංකි | 01යි |
| | | iii. | ලෑලි රාමු | 01යි |
| 46. | ඒ/1930/07 | | HADEEL වර්ගයේ කැසට් රේඩියෝ | 01යි |
| 47. | 77221 | | පැනසොනික් ආර්එස් 510 කැසට්රේඩියෝ | 01යි |
| 48. | 48821 | | විදුලි ග්‍රයින්ඩර් | 01යි |
| 49. | 2933 | i. | රන්පැහැති ඉමිටේෂන් පෙන්ඩන්ට් | 01යි |
| | | ii. | රන් පැහැති ඉමිටේෂන් බැරල් මුදු | 01යි |
| | | iii. | රන් පැහැති ඉමිටේෂන් අත් පළඳනා | 01යි |
| | | iv. | ලණුවක හැඩයට අඹරන ලද රන් පැහැති ඉමිටේෂන් මාල | 01යි |
| | | v. | මලක හැඩයට පෙන්ඩනය සහිත රන් පැහැති ඉමිටේෂන් මාල | 01යි |
| | | vi. | රන් පැහැති ඔරලෝසු පටි කෑලි | 02යි |
| | | vii | මැද කොටස පුම්බා ඇති ඉමිටේෂන් වළලු | 01යි |
| 50. | 81949 | | බෆල් 02ක් සහ රේඩියෝ කෑබලි අඩංගු පෙට්ටිය | |

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|---|
| 51. | 95080 | | සිසිල් වර්ගයේ අක්‍රීය ශීතකරණ | 01යි |
| 52. | 95081 | i. | නැෂනල් වර්ගයේ අක්‍රීය රෙදි සෝදන යන්ත්‍ර | 01යි |
| | | ii. | අක්‍රීය තත්ත්වයේ ඇති වෝටර් කූලර් | 01යි |
| | | iii. | ෆිලිප්ස් වර්ගයේ අක්‍රීය ශීතකරණ | 01යි |
| | | iv. | සිසිල් වර්ගයේ අක්‍රීය ශීතකරණ | 01යි |
| | | v. | නැෂනල් වර්ගයේ දොරදෙක අක්‍රීය ශිතකරණ | 01යි |
| 53. | 94776 | i. | අංක ඩබ්පීඑච්ටී 4358 දරන ත්‍රීරෝද රථයේ අංක ඒජීඑම්බීකේජේ 82815 දරන එන්ජිම | |
| | | ii. | අංක ඩබ්පීඑච්ටී 4358 දරන ත්‍රීරෝද රථයේ ඉදිරිපස මුහුණත සහිත අංක 24 එෆ්බීකේජේ 60395 දරන චැසිය | |
| | | iii. | එහි පැති දොර සහ අමතර කොටස් අඩංගු කවරය | |
| 54. | 60551 | | කොළපාට ටෙන්ට් රෙදි | 01යි |
| | | | සිල්වර් පාට ටෙන්ට් රෙදි | 01යි |
| 55. | ඒ/744/08 | | අංක ඒඑච් 50310021 දරන දිරාපත් පාපැදි | 01යි |
| 56. | ඒ/313/08 | | සින්කොපි වර්ගයේ අංක 07137 දරන නිකල්පාට කාන්තා පාපැදිය | |

01-745

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 සමාගම් ආඥාපනතේ ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008.12.31 වැනි දින ලියාපදිංචි කර ඇත.

සමාගමේ නම : ලීගල් රිසර්ච් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 66645
ලියාපදිංචි ලිපිනය : අංක 220, පාක් රෝඩ්, කොළඹ 05

ජේසී ඇන්ඩ් කම්පැණි,
සමාගම් ලේකම්වරු.

අංක 41, ජනාධිපති මාවත,
කොළඹ 01.

01-746

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

එංගලන්තයේ ලීඩ්ස් LS 29 7RQ වෝර්ෆඩේල්හි බර්ලි, සැන්ඩ්හෝල්ම් ඩ්‍රයිව්, අංක 68 හි පදිංචි ජෝන් කැරොල් සහ හෙයිසල් කැරොල් යන අප දෙදෙනා විසින් අළුත්ගම ගඟබඩ පාරේ අංක 125/47 දරන ස්ථානයේ පදිංචි විජේතුංග පටබැඳිගේ සුභාජි දේශප්‍රිය සිල්වා වෙත ඇටර්නි බලය පවරමින් කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කමණී පී. ද සිල්වා ලවා ලියා සහතික කරන ලද අංක 3356 හා 2004 අගෝස්තු මස 14 වැනි දින දරන ඇටර්නි බලකරය වර්ෂ 2008 ක් වූ අගෝස්තු මස 16 වැනි දින අවලංගු කොට එය නීත්‍යානුකූලව අහෝසි කරන ලද බව අදාළ සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමු.

ජෝන් කැරොල් සහ හෙයිසල් කැරොල්.

01-747

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාජගිරිය, රාජගිරිය පාරේ අංක 71/14 හි පදිංචි හේමලතා අබේසිරි මුණසිංහ වන මා ප්‍රසිද්ධ නොතාරිස් අලංකා ඩී. ඇන්තනි විසින් ලියා සහතික කරන ලද අංක 08 දරන 2006.11.27 ඇටෝර්නි බලපත්‍රය මගින් වත්තල එඬේරමුල්ල සිළුමිණ මාවත, අංක 142/බී1හි පදිංචි තෙව්වාහන්දි තුසිතා නාමලි සිල්වා යන අයට දෙන ලද මාගේ ඇටෝර්නි බලය අවලංගු කළ බව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ඉහත සඳහන් තෙව්වාහන්දි තුසිතා නාමලි සිල්වා යන අය විසින් මින් ඉදිරියට මා වෙනුවෙන් කරනු ලබන කිසිඳු ගනුදෙනුවකට හෝ ක්‍රියාවකට මා වග නොකියන බව ඉහත සඳහන් සියලු දෙනා වෙත වැඩිදුරටත් දන්වා සිටිමි.

හේමලතා අබේසිරි මුණසිංහ.

2008ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින දී ය.

01-757

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව 2008 ජූනි 25 වැනි දින සිදු කරන ලද පහත සඳහන් සංස්ථාගත කිරීම පිළිබඳව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඉන්ටනැෂනල් සයන්ටිෂන් ඇස්ට්‍රොලොජිකල් රිසර්ච් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 64594
ලියාපදිංචි ලිපිනය : අංක 75/17, ශ්‍රී නන්ද ජෝතිකාරාම පාර, කලල්ගොඩ, පන්නිපිටිය.

සමාධි බණ්ඩාර මිය,
සමාගම් ලේකම්.

අංක 75/17, ශ්‍රී නන්ද ජෝතිකාරාම පාර,
කලල්ගොඩ,
පන්නිපිටිය.

01-789

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වර්ෂ 2004.12.23 වැනි දින දරන ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් සුමිත් ධම්මික ද සිල්වා මහතා විසින් සහතික කළ අංක 191 දරන ඇටර්නි බලපත්‍රයේ ඇටර්නි බලපත්‍ර දීමනාකරු වන අම්බලන්ගොඩ, රන්දොඹේ, අංක 719 දරන ස්ථානයේ පදිංචි අංක 712782765 V දරන ජාතික හැඳුනුම්පත හිමි පෙරුමාදුර පාලිත චන්ද්‍රලාල් ද සිල්වා වන මම, ඉහත කී ඇටර්නි බලපත්‍රය මගින් අම්බලන්ගොඩ, රන්දොඹේ අංක 719 දරන ස්ථානයේ පදිංචි අංක 652030211 V දරන ජාතික හැඳුනුම්පත හිමි පෙරුමාදුර පාලිත චන්ද්‍රසෝම ද සිල්වා යන අයට දී ඇති ඇටර්නි බලය මෙයින් අවසාන කොට අවලංගු කරන බවට ද මින් මතුවට ඉහත කී පෙරුමාදුර පාලිත චන්ද්‍රසෝම ද සිල්වා මගේ ඇටර්නි බලකරු නොවන බවට ද, ප්‍රකාශ කරමි. තවද ඉහත අංක 191 දරන ඇටර්නි බලපත්‍රය නිසි පරිදි ඇටර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ පොතේ ඡේද/පිටු 04/133 පත්‍රිරුවේ 19 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කර ඇත.

පෙරුමාදුර පාලිත චන්ද්‍රලාල් ද සිල්වා.

2009 ජනවාරි මස 09 වැනි දින.

01-771

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව 2008 ඔක්තෝබර් මස 30 වැනි දින සිදු කරන ලද පහත දැක්වෙන සංස්ථාගත කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සෙන්ස් (Zenss) ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 66022
ලියාපදිංචි ලිපිනය : # 24, පළමු පටුමග, රත්මලාන.

සමාධි බණ්ඩාර මිය,
සමාගම් ලේකම්.

අංක 75/17, ශ්‍රී නන්ද ජෝතිකාරාම පාර,
කලල්ගොඩ,
පන්නිපිටිය.

01-776

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - මරදාන ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. සමරනායක විසින් හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දාවූ 2006.10.27 වැනි දින හා අංක 1278 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නාරනපිටි පතිරුන්නැහැලාගේ ෂදිෂ් පතිරන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009ක් වූ පෙබරවාරි මස 24 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, කහතුඩුව පිහිටි කහතුඩුව ස්ටේට් නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එම්. සමරනායක විසින් මැන සාදන ලද 2002.08.01 සිට 11 දක්වා දිනයන්හි අංක 8244 දරන පිඹුරේ ලොට් අංක 178 දරන ඉඩම් කොටස වේ.

විශාලත්වය : පර්චස් 10.7 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.14 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.28 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස් , තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

01-806/1

**ඩීඑෆ්සීසී බැංකුව**

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන)

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1423 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවාය කෝරළේ, වීරසේකරගම පිහිටා ඇති බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සකසන ලද 2004 නොවැම්බර් මස 07 වැනි දිනැති අංක 4705 දරන පිඹුරු පතෙහි දක්වා ඇති කදිරේකුඹුර ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන්කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ් 1 පර්. 10

එහි පිහිටි සියල්ල සහිතව

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් සහතික කරන ලද 2006 ජූලි මස 31 වැනි දාතමින් යුතු අංක 1423 දරන උකස්කරය ප්‍රකාර වැල්ලවාය දූලිකා ටෙක්ස් නම් ව්‍යාපාරය පවත්වාගෙන යන රංජිත් ජයසිංහ සහ පරණගමගේ සුමනතිස්ස (මින් පසුව මෙහි 'හවුල්කරුවන්' ලෙස හැඳින්වෙන) යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී, පෙරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 පෙබරවාරි මස 17 වැනි දින, (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 36,250 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර, සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංකය : 011-2440366/77

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ
දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

01-819

---

**පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත් කුරු කෝරළේ දකුණේ, වැල්ලම්පිටියේ, කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවට අයත් අඹතලෙන් පහල කිට්ටම්පහුව ග්‍රාමයේ පිහිටි අංක 44/16 දරන වඩාත් නිවැරදිව සඳහන් කරන්නේ නම් අංක 44/16 (කොටස) කිට්ටම්පහුව යන ලිපිනය දරන බලයලත් මිනින්දෝරු පී. වෙතාවලම් විසින් සකස් කරන ලද 2004 ජූලි මස 20 වැනි දින දරන පිඹුරුපත් අංක 980/2004 හි ලොට් අංක 2 බී ලෙස සඳහන් 'දෙහිගහපිටිය' ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ් 0 පර්. 7.00

*මාර්ගය සහ පිහිටීම* .- කොළඹ සිට ලෝ ලෙවල් පාරේ, වැල්ලම්පිටිය මං සන්ධියේ සිට මීටර් 175ක් දුරින්, වම් පසින් කොටුවිල පාර පිහිටා ඇත (විවියන් ගුණවර්ධන මාවත) මෙම පාරේ මීටර් 375ක් පමණ දුරින් වම් පසින් සිමෙන්ති අච්චු වැඩපලක් දක්වා දිවෙන මාර්ගයකි. මෙම පාරේ මීටර් 100ක් පමණ දුරින් දකුණත පැත්තේ මෙම දේපල පිහිටා ඇත. වැල්ලම්පිටියේ සිට මෙම දේපලට ඇත්තේ මීටර් 650කි. බස් මාර්ග අංක 134 සහ ලෝ ලෙවල් පාරේ ගමන් ගන්නා අනෙකුත් බස්රථ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කරන ලද 2006 මාර්තු මස 30 වැනි දින දරන අංක 2019 සහ අංක 2020 දරන උකස්කරයන් මත, මොහොමඩ් දාවුද් මොහොමඩ් ශරීක් විසින් පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී (සීමාසහිත පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් හා පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) ට උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටුකර නැත.

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 පෙබරවාරි මස 20 වැනි දින (සිකුරාදා) පස්වරු 2.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය. - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය.:

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිළෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 90,000.00 ට නොඅඩු සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2009 ජනවාරි මස 16 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද, 2009 ජනවාරි මස 16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩි විස්තර, ඔප්පුව සහ වෙනත් ආදළ ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ලබා ගැනීමට කොළඹ 03, ගාලු පාරේ අංක 450, සීමාසහිත පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති අමතන්න.

දුරකථන අංක : 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකලය ලත්, ශ්‍රී ලංකාවේ
ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
උපදේශක තක්සේරුකරුවෝ සහ ඉඩම්
අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

01-790/2

## සෙලාන් බැංකුව පීඑල්සී-ගනේමුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ පලුගහවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 1995.06.21 දිනැති අංක 9413 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහනවයක් (අ. 0 රූ. 0 පර්. 19) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

*පහත විස්තර කරනු ලබන අයුරු මාර්ග ප්‍රවේශය සමග.*- පෙර කී පලුගහවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 1995.06.21 දිනැති අංක 9413 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ. 0 රූ. 0 පර්. 18) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ සමග ඉඩම.

පෙර කී පලුගහවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 1995.06.21 දිනැති අංක 9413 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 සී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම හතරක් (අ. 0 රූ. 0 පර්. 3.4) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් එකී ඉඩම් පහත විස්තර කරනු ලබන ඉඩමේ අතුරු බෙදූ කොටස වේ :

පෙර කී පලුගහවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 1992. 11.15 දිනැති අංක 8045 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකක් (අ. 0 රූ. 1 පර්. 1) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරුව ඊ 722/137 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපල දෙදෙනාම ගනේමුල්ල පදිංචි ගම්මැදලියනගේ ඇන්තනී සුනිල් මැන්දිස් සහ ඈන් නිරෝෂන් ලෝපස් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2009 පෙබරවාරි මස 20 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* -කොළඹ සිට මීගමුව ප්‍රධාන පාරේ මීගමුව තෙල්වත්ත හන්දියෙන් කිඹුලාපිටිය පාරට හැරී කිඹුලාපිටිය හන්දිය පසුකර 9 වන කි. මී. කණුව පසුකර මීටර් 500ක් ගිය විට කෝර්ට්

කොලෝතින් ඇඟලුම් කර්මාන්ත ශාලාවට පෙර දකුණට ඇති ප්‍රාදේශීය සභා පාරේ මීටර් 700ක් ඉදිරියට ගිය විට අදාල දේපල හමුවේ.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2006.07.14 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2006.07.06 වැනි දින ද, වීරකේසරී පුවත්පතේ 2006.07.07 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% වන පළාත් අධිකාරී බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක 011-2696155, 011-2572940.

01-807

---

## සම්පත් බැංකුව පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

යූ. එල්. අයි. එස්. කේ. විජේසිංහ - ගිණුම් අංක 0023 1600 2028

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.08.30 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2008.07.11 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ ද* 2008.05.02 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත්වල ද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස්එක් ලක්ෂ හැත්තෑපන්දහස් දෙසිය පහකුත් ශත අසූනවයක (රු. 31,75,205.89 ක් පමණයි) සම්පූර්ණ මුදල සහ රුපියල් විසිනව ලක්ෂ විසිඑක් දහස් නවසිය අසූහයකුත් ශත හතලිස් දෙකක (රු. 29,21,986.42ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහතර (14%) බැගින් 2007 ජුනි මස 07 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද, සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේනම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් 2009.02.19 වැනි දින පෙ. ව./ප.ව. 10.30 ට සහ 2. 30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල කෝරළේ කටුගම්පොල හත්පත්තුවේ, උඩුබද්දාව ප්‍රාදේශීය සභා සීමාව තුළ පලුගමුවේ පිහිටි 'අගරවත්ත' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් සාදන ලද 2002 නොවැම්බර් මස 13 දාතම හා අංක 4952 බී දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව කේ 206/66 හි ලියාපදිංචි කර ඇති එකී අංක 4952 බී දරන පිඹුරට අනුව උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : අංක 4980 පිඹුරේ ලොට් 1 ද, දකුණට මාදම්පේ - උඩුබද්දාව ප්‍රධාන මාර්ගය ද සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0 රූඩ් 0 පර්. 20) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස, එහි පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි සහ එයට අදාල අනෙකුත් සියලු දේ හා සමගය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් ලියා සහතික කළ 2006 ජූලි මස 25 දාතම හා අංක 1590 දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාර උකස් තබා පවරන ලදී.

වයඹ පළාතේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කිනියම කෝරළේ කටුගම්පොල හත්පත්තුවේ බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මුරුකන්ඩියේ පිහිටි **'තිඹිරිගහවත්ත'** නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු වර්නන් පෙරේරා විසින් සාදන ලද 2002 ජනවාරි මස 05 දාතම හා අංක 8126 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ වෙලුම/පත්ඉරුව එම් 126/294 හි ලියාපදිංචි කර ඇති එකී අංක 8126 දරන පිඹුරට අනුව උතුරට : හලාවත කුරුණෑගල ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : අංක 8126 පිඹුරේ ලොට් 2ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම එකොලහක් (අක්. 0 රූඩ් 0 පර්. 7.11) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ හා සමගය.

ඉහත කී මුරුකන්ඩියේ පිහිටි **'තිඹිරිගහවත්ත'** නමැති ඉඩමේ අංක 8126 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට දක්වා ඇති කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ වෙලුම/පත්ඉරුව එම් 126/293 හි ලියාපදිංචි කර ඇති එකී අංක 8126 පිඹුරට අනුව උතුරට : හලාවත - කුරුණෑගල ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : අංක 8082 පිඹුරේ ලොට් 3 ද, දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස ද, සහ බටහිරට : අංක 8126 පිඹුරේ ලොට් 1 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම අටයි නවයක් (අක්. 0 රූඩ් 0 පර්. 5.89) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ හා සමගය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් ලියා සහතික කළ 2006 ජූලි මස 25 වැනි දින හා අංක 1592 දරන උකස් බැදුම්කරයේ බලය අනුව උකස් තබා පවරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

01-818/6

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ප්‍රයිවෙට් බෑන්කින් යුනිට්**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ කඩුවෙල බත්තරමුල්ල ප්‍රාදේශීය සභා ඒකක සීමාව තුළ තලංගම උතුරු කොස්වත්ත පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද 2005 මැයි මස 04 වැනි දිනැති අංක 1851 ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොටකිඹුලාවත්ත ඕවිට සහ අස්වැද්දුව කුඹුර සහ පලදයා කුඹුර නැමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම් සහ එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ දැන් කඩුවෙල පාර, වරිපනම් අංක 246/ඒ දරන ලොට් 1 ඒ 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස්හතක් (අ. 0 රූ. 1 පර්. 37) නොහොත් හෙක්ටයාර් 0.19476 විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව පී 1626/147 හි ලියාපදිංචි කර ඇත.

මෙම දේපල දෙහිවල පදිංචි නිමලේන්ද්‍රන් රාගවාන් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2009 පෙබරවාරි මස 24 වැනි දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම* .- කොළඹ සිට කඩුවෙල පාරේ බත්තරමුල්ල හන්දියට පැමිණ එතැන් සිට කෙලින්ම කඩුවෙල පාරේ තවත් කි. මී. 1ක් ඉදිරියට ගිය විට පාරේ දකුණු පස කඩුවෙල පාරට මුහුණලා අදාල දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2008.12.05 වැනි දින පළ වී ඇති අතර ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත් වල 2008.09.04 වැනි දින ද වීරකේසරී පුවත්පතේ 2008.09.09 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මුදලින් (10%) සියයට දහයක් ද, 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිළෙන් 1%ක් වන පළාත් අධිකාරී බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු, විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකය : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිරුකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
දුරකථන අංකය : 060-2068185, 011-2696155, 011-2572940.

01-808

---

**හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියා සහතික කරන ලද්දාවූ 2006.08.22 වැනි දින හා අංක 2492 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පොල්වත්තගේ රවින්ද්‍ර ගෝමිස් සහ පොල්වත්තගේ ධර්මසේන ගෝමිස් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2009ක් වූ පෙබරවාරි මස 20 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාව තුළ කළුබෝවිල, පිහිටි සිරිගල් මාවතේ වරිපනම් අංක 21 ඒ ලෙස දැක්වෙන කොස්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 2005.05.17 වැනි දින මැන සාදන ලද අංක 3368/9000 පිඹුරේ හි ලොට් අංක එක්ස් දරන ඉඩම් කොටස වේ.

විශාලත්වය රූඩ් 1යි, පර්චස් 26

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.14 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.26 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද ;
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද ;
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස් , තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

දුරකථන අංකය : 2863121.

01-806/2

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හලාවත ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්ටෝ විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියා සහතික කරන ලද්දාවූ 2004.05.27 වැනි දින හා අංක 4194 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වර්ණකුලසූරිය නිමල් නිකලස් ප්‍රනාන්දු සහ වීරපුරගේ රංජිත තරංග යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2009ක් වූ පෙබරවාරි මස 19 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත මහ ලේකම් කොට්ඨාසය තුළ ලියාපදිංචි වී ඇති මුන්නේස්වරම් පත්තුවේ උතුරු පිටිගල් කෝරළයේ ඉනිගොඩවෙල ග්‍රාමසේවක කොට්ඨාසයට අයත් ඉනිගොඩවෙල ග්‍රාමයෙහි 'සීදුව වත්ත' නමැති ඉඩමට බලයලත් මානක එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් 2001.04.16 වැනි දින මැන සාදන ලද අංක 3388 පිඹුරේ හි ලොට් අංක 2 දරන ඉඩම් කොටස වේ.

විශාලත්වය - පර්චස් 39.93

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.14 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.26 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද ;
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද ;
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද ;
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස් , තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

01-806/3

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - ගාල්ල නගර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ) විධිවිධාන පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) හි අධ්‍යක්ෂ මණ්ඩලය මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර බලයලත් මානක අයි. කොටම්බගේ විසින් 2001 අගෝස්තු මස 18 වැනි දින සාදන ලද අංක 1134 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතරේ සහ මහ නගර සභා සීමාව තුළ ගාලුපියද්ද පිහිටි වරිපනම් අංක 7 දරන අමන්තොට්ටම් හෙවත් විස්ට්‍රම් තොට්ටම් කියන ඉඩමේ ලොට් 2 දරන පර්චස් දහතුනයි දශම දෙකයි එකක් (අ. 0 රූ. 0 පර්. 13.21) හෝ (හෙක්. 0.0334) විශාල ඉඩම සහ වරිපනම් අංක 07 දරන ගොඩනැගිලි, භූමිය ගසකොළ වගාවන් සහ සියළු දේත් සමඟ වේ.

බටුවත්ත ඔටෝ ලෑන්ඩ් යන නාමය සහ විලාශය යටතේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අදිකාරම් බටුවත්ත ගමගේ අනුර ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2009ක් වූ පෙබරවාරි මස 20 වැනි දින ප. ව. 2.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.11.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, සහ 2008.11.17 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න.

විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.01.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.03 වැනි දින දිවයින, සහ අයිලන්ඩ්, පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම*.- ගාල්ල කඩවීදියේ, ඕල්කොට් පිළිරුව අසලින් පටන් ගෙන ඕල්කොට් මාවත ඔස්සේ යාර 350ක් පමණ කොට්ටඩිය මංසන්දිය දක්වා ගොස් දකුණට හැරී අබ්දුල් වහාබ් මාවත ඔස්සේ යාර 150 පමණ ගොස් නැවතත් දකුණට හැරී පෙට්ටිගල වත්ත හරස් පාරේ යාර 25ක් පමණ ගිය විට අදාල දේපළ දකුණු පසින් හමු වේ. අදාල දේපල එකී 11 වන හරස් පාරට යාබදව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිළෙන් සියයට දෙකයි දශම පහක් (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව රු. 2,000 ;
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් ;
7. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගාල්ල නගර ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු,
බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය,
බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 130, මහවීදිය,
ගාල්ල.
දුරකථන අංක : 091-2234356
091-2234469
ෆැක්ස් අංකය : 091-2234467

01-792

---

## පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ) විධිවිධාන පනතේ 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරී පත්තුවේ කැළණිය ප්‍රාදේශීය සභා සීමාවට අයත් දළුගම උප කාර්යාල අංක 1, දළුගම ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සකස් කරන ලද 1997 නොවැම්බර් මස 20 වැනි දින දරන පිඹුරුපත් අංක 1350 හි ලොට් අංක 4 (බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සකස් කරන ලද 1992 ඔක්තෝබර් මස 08 වැනි දින දරන පිඹුරුපත් අංක 683 හි ඒකාබද්ධ කරන ලද ලොට් අංක A හා B හි උප කොටසක් වන) ලෙස සඳහන් 'කෝන්ගහවත්ත' සහ 'කහටගහවත්ත' ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ් 0 පර්. 5.8

එහි පිහිටි සියල්ල සහ 1997 නොවැම්බර් මස 20 වැනි දින දරන පිඹුරුපත් අංක 1350 ලොට් අංක 6 පිහිටි මාර්ග අයිතිය ද සමග.

*මාර්ගය සහ පිහිටීම* .- කොළඹ කොටුවේ සිට කොළඹ - මහනුවර 'ඒ 1' මහා මාර්ගයේ 10/2 බෝක්කුවට ආසන්නයේ, ඊට පෙර දකුණත දෙසට පිහිටි පෞද්ගලික පාරේ මීටර් 100ක් පමණ දුරින්, දකුණත පැත්තේ පිහිටා ඇත. එහි සිට කිරිබත්ගොඩට දුර කි. මී. 2ක් වන අතර කොළඹ කොටුවට දුර කි. මී. 10කි. බස් මාර්ග අංක 1, 19, 200 සහ නුවර පාරේ ගමන් කරන අනෙකුත් ඒවා.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කරන ලද 2006 මැයි මස 08 වැනි දින දරන අංක 2063 උකස්කරය මත, මැදගමගේ චමින්ද ජයවීර විසින් පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන්

පීඑල්සී (සීමාසහිත පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් හා පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) ට උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටුකර නැත.

පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 පෙබරවාරි මස 20 වැනි දින (සිකුරාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය. :-

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිළෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 90,000 ට නොඅඩු සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2009 ජනවාරි මස, 15 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද, 2009 ජනවාරි මස, 16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩි විස්තර, ඔප්පුව සහ වෙනත් අදාළ ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ලබා ගැනීමට කොළඹ 03, ගාලු පාරේ අංක 450, සීමාසහිත පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ කළමනාකරු -නීති අමතන්න.

දුරකථන අංක : 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ,
උපදේශක තක්සේරුකරුවෝ සහ
ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

01-790/1

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 1/29653/සීඩී1/026.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.10.31 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2006.11.14 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474 හි බලයලත් වෙන්දේසිකාර ආර්.එස්. මහානාම මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.02.23 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව නගර සභා සීමාව තුළ කටුකුරුන්දේ පිහිටි සෙන්ට්‍රික් පෙදෙස් වරිපනම් අංක 12බී දරන්නාවූ පයිරුගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. එස්. පෙරේරා විසින් මැන සැකසුණු 1988.01.23 වැනි දින හා අංක 2529 දරන පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්.10.615 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක එම් 1591/287 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස 16 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 3.

01-802/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 2/55788/ජේ2/146.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.03.12 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2004.05.14 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව

ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474 හි බලයලත් වෙන්දේසිකාර ආර්.එස්. මහානාම මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.02.23 වැනි දින පස්වරු 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ රන්මුතුගල පිහිටි වැවහේනවත්ත හෙවත් අඹගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්.ඒ.වී. පෙරේරා විසින් මැන සැකසුණු 1983.07.05 වැනි දින හා අංක 1947 ඒ දරන පිඹුරේ කැබලි අංක 7 ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0,රූ.0, පර්. 18ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක සී 390/183 හි ලියාපදිංචි වී ඇත.

තව ද එකී අංක 1947/ඒ දරන පිඹුරේ කැබලි අංක 9 මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස, 16 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 3.

01-802/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 6/40481/එල්6/918.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.12.19 වැනි දින *ගැසට්* පත්‍රයේ සහ 2008.12.22 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතා, විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.02.27 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවතුළ ( පයාගල මග්ගොනබැද්ද උප කාර්යාලය) කළුතර පයාගල බැද්ද තොටමුනේ උතුරු දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී.ප්‍රේමරත්න විසින් මැන සැකසූ 1999.02.25, 1999.02.26, 1999.02.27 සහ 1999.03.05 දිනැති අංක 2526 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 136 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ.0, පර්.12 ක් වූ බෙදා වෙන් කල බිම්කොටස සහ ඒ මත පිහිටි සියළු දේත් සමඟ වේ.

මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක එච්. 229/152 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස, 16 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 3.

01-802/3

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 6/43545/එච්6/524.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.05.07 වැනි දින *ගැසට්* පත්‍රයේ සහ 2008.11.22 වැනි දා ලංකාදීප පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතා, විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.02.27 වැනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පලන්නොරුවේ තලගල ගමේ පිහිටි ඔලබොඩුකන්ද වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් 1989.02.11 දිනැතිව සකසන ලද අංක 1317 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 8 ලෙස බෙදා වෙන් කොට දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0,රූ.0, පර්. 11.75 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියළු දේත් සමඟ වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක සී 178/193 හි ලියා පදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ජනවාරි මස, 16 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 3.

01-802/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.